# වැවිලි අමාත්‍යාංශය
# பெருந்தோட்ட அமைச்சு
# Ministry of Plantation

11 මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල.

11ஆம் மாடி,செத்சிரிபாய இரண்டாம் தொகுதி, பத்தரமுல்ல.

11th Floor, Sethsiripaya Stage II, Battaramulla.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 0112 187 111
Fax: 0112 186 093
ලේකම් / செயலாளர் / Secretary: 0112 186 017
Fax: 0112 186 016
ඊ-මේල් / ஈ-மெயில் / E-mail: secypi2016@gmail.com
කාර්යාලය / அலுவலகம் / Office: 0112 186 160
ෆැක්ස් / தொலைநகல் / Fax: 0112 186 076
Web - www.plantationindustries.gov.lk


ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය / எனதுஇல / My No. MPI /Dev.I/03/GEN/02 (vol iii)

දිනය / திகதி / Date 28 .10.2020

**ලේකම්,** මුදල් අමාත්‍යාංශය
**ලේකම්,** ආරක්ෂක අමාත්‍යාංශය
**ලේකම්,** සෞඛ්‍ය අමාත්‍යාංශය
**ලේකම්,** විදේශ අමාත්‍යාංශය
**ලේකම්,** කර්මාන්ත අමාත්‍යාංශය
**ලේකම්,** කෘෂිකර්ම අමාත්‍යාංශය
**ලේකම්,** වරාය හා නාවික අමාත්‍යාංශය
**සභාපති,** කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බලකාය
**පොලිස්පති,** ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය
**අධ්‍යක්ෂ ජනරාල්,** ශ්‍රී ලංකා රේගුව
**අධ්‍යක්ෂ ජනරාල්,** වාණිජ දෙපාර්තමේන්තුව
**අධ්‍යක්ෂ ජනරාල්,** කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
**අධ්‍යක්ෂ ජනරාල්,** ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව
**සභාපති,** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
**සභාපති,** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
**සභාපති,** ශ්‍රී ලංකා වරාය අධිකාරිය
**අධ්‍යක්ෂ,** ජාතික පොහොර ලේකම් කාර්යාලය

## COVID 19 අවදානම හමුවේ වැවිලි ක්ෂේත්‍රයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට ඉමහත් දායකත්වයක් සපයන වැවිලි ක්ෂේත්‍රය මඟින් වසරකට රු. බි. 570 ක් පමණ වන අපනයන ආදායමක් උපයා දෙනු ලබන අතර සමස්ත වශයෙන් මිලියන 4 කට අධික පිරිසකට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සපයා දෙනු ලැබේ.

රජයේ ප්‍රධාන සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් තෝරා ගෙන ඇති මෙම ක්ෂේත්‍රය කිහිප ගුණයකින් වර්ධනය කිරීම සඳහා කටයුතු සැලසුම් කෙරෙන මෙම තීරණාත්මක මොහොතේ අනපේක්ෂිත ගැටළුවකට මුහුණ දීමට සිදු වීම ඉතා කණගාටුදායක තත්ත්වයක් වන අතර, වගකිව යුතු සියළු පාර්ශව මෙම තත්ත්වය අවබෝධ කර ගනිමින් අපනයන ආර්ථික කටයුතුවලට සිදුවන බලපෑම අවම කර ගනිමින් සෞඛ්‍ය අවධානම කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව තිබේ.

පසුගිය මාර්තු මස සිට උද්ගත වූ COVID 19 වසංගත තත්ත්වය හමුවේ වැවිලි ක්ෂේත්‍රයේ කටයුතු පවත්වා ගෙන යාමේදී ඇති වූ දුෂ්කරතාවයන් හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවල නිරත පිරිස දැඩි අපහසුතාවයකට පත් විය. එම තත්ත්වය පාලනය කිරීමේදී ඔබ ලබා දුන් දායකත්වය කුඩා තේ වතු හිමියන් ඇතුළු වැවිලි ක්ෂේත්‍රයේ ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමට සහ ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාමට මනා පිටුවහලක් වූ අතර ඔබ විසින් දැක්වූ දායකත්වය බෙහෙවින් අගය කිරීමටද මෙය අවස්ථාව කොට ගනිමි.

එමෙන්ම, නැවතත් රට තුළ අවදානම් තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් වතු හිමියන් ඇතුළු වැවිලි ක්ෂේත්‍රයේ නිරත පහත සඳහන් ප්‍රජාව හට ස්වකීය ජීවනෝපායෙහි අඛණ්ඩව යෙදීමටත්, නිෂ්පාදන කර්මාන්ත හා අපනයන කර්මාන්ත කටයුතු සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් හා නියාමනයන්ට අනුකූලව යථා පරිදි පවත්වාගෙන යාමටත්, අත්‍යවශ්‍ය පහසුකම් හා සේවා සැපයීමටත් අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

i. දළු නෙළන්නන්
ii. කිරි කපන්නන්
iii. පොල් කඩන්නන්
iv. අපනයන කෘෂි භෝග ඇතුළු වගාවන් හා ඊට සේවා සලස්වන්නන්
v. අස්වනු/නිෂ්පාදන එකතු කරන්නන් ඇතුළු විවිධ පිරිස් මෙන්ම,
vi. කර්මාන්තශාලා හිමියන්
vii. වෙන්දේසිකරුවන්
viii. තැරැව්කරුවන්
ix. ඇසුරුම්කරුවන්
x. අපනයකරුවන්

තවද, දිවයිනේ විවිධ ස්ථානවල සිට කොළඹ හෝ ගම්පහ දිස්ත්‍රික්කවල පිහිටි ගුදම් කරා තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස් ඇතුළු වෙළඳ ද්‍රව්‍ය ප්‍රවාහනයේදී ගබඩා කර තබා නැව්ගත කිරීමේදී නිසි සෞඛ්‍යමය තත්ත්වයන් පවත්වා ගනිමින් කටයුතු කිරීමේ වැදගත්කම මෙන්ම නිර්බාධිතව අපනයන කටයුතු සිදුවන බවට වග බලා ගැනීම ජාතික වැදගත්කමකින් යුත් කරුණක් බව විශේෂයෙන් සඳහන් කරමි.

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය හුදෙක්ම අගය කරමි.

**රවීන්ද්‍ර හේවාවිතාරණ**
ලේකම්
වැවිලි අමාත්‍යාංශය

**පිටපත්:**

1. **ලේකම්,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
2. **ලේකම්,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය
3. **ලේකම්,** උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කරු. පසු විපරම් කිරීම සඳහා

4. **අධ්‍යක්ෂ ජනරාල්,** රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
5. **සභාපති,** ශ්‍රී ලංකා තේ මණ්ඩලය
6. **සභාපති,** තේ පර්යේෂණ මණ්ඩලය
7. **සභාපති,** කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
8. **සභාපති,** රබර් පර්යේෂණ මණ්ඩලය
9. **සභාපති,** තල් සංවර්ධන මණ්ඩලය
10. **සභාපති,** තුරුසවිය අරමුදල
11. **සභාපති,** සී/ස ඇල්කඩුව වැවිලි සමාගම
12. **සභාපති,** සී/ස කුරුණෑගල වැවිලි සමාගම
13. **සභාපති,** සී/ස හලාවත වැවිලි සමාගම
14. **සභාපති,** ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
15. **සභාපති,** පොල් සංවර්ධන අධිකාරිය
16. **සභාපති,** පොල් පර්යේෂණ මණ්ඩලය
17. **සභාපති,** පොල් වගා කිරීමේ මණ්ඩලය
18. **සභාපති,** සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම
19. **මහ ලේකම්,** ශ්‍රී ලංකා රබර් මහ ලේකම් කාර්යාලය
20. **තේ කොමසාරිස්,** ශ්‍රී ලංකා තේ මණ්ඩලය
21. **සභාපති,** සමස්ථ ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානය
22. **සභාපති,** වැවිලිකරුවන්ගේ සංගමය
23. **සභාපති,** ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය
24. **සභාපති,** කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය
25. **සභාපති,** තේ අපනයනකරුවන්ගේ සංගමය
26. **සභාපති,** කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය
27. **සභාපති,** ශ්‍රී ලංකා රබර් කර්මාන්තකරුවන්ගේ සංගමය
28. **සභාපති,** කොළඹ රබර් වෙළඳුන්ගේ සංගමය
29. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන නිපදවන්නන්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමය
30. සභාපති, පොල් වගාකරුවන්ගේ සංගමය
31. සභාපති, දිසිදි පොල් නිෂ්පාදකයින්ගේ සංගමය
32. සභාපති, ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමූපකාර සමිති සංගමය
33. සභාපති, වෙන්නප්පුව කොහු කර්මාන්ත හිමියන්ගේ සංගමය
34. සභාපති, පොල් නිෂ්පාදකයින්ගේ තැරැව්කරු හා වෙන්දේසිකරුවන්ගේ සංගමය
35. සභාපති, කොහුබත් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්ගේ සංගමය
36. සභාපති, පොල් නිෂ්පාදකයින්ගේ හා අපනයනකරුවන්ගේ සංගමය
37. සභාපති, ශ්‍රී ලංකා කොහු කෙඳි අපනයනකරුවන්ගේ සංගමය
38. සභාපති, සමස්ත ලංකා පොල්තෙල් මෝල් හිමියන්ගේ සංගමය
39. සභාපති, නැවුම් පොල් තෙල් නිෂ්පාදකයන්ගේ සංගමය

කරු. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා